**www.wsws.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපති සහන කටයුතුවල පාලනය මිලිටරියට භාර දෙයි

**Sri Lankan president puts military in charge of relief operations**

**විජේ ඩයස් විසිනි**
**2005 ජනවාරි 14**

ශ්‍රී ලංකාවේ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, ජනවාරි 3 දා අත්‍ය-සමාන පියවරක් ගනිමින්, දිවයිනේ සියලු සහන සේවා කටයුතු සන්නද්ධ හමුදාවල පාලනයට යටත් කලා ය. පසු දින, ඇය, මිලිටරියට පුලුල් බලතල ලබා දෙමින් විපතට පත් ප්‍රදේශවලට හදිසි නීතිය ද පැනවූවා ය. එය වනාහි කිසිදු ප්‍රසිද්ධියකින් තොරව ගැනුනු තීන්දුවකි.

මෑතදී ආරක්ෂක මාන්ඩලික ප්‍රධානියා ලෙස පත් කෙරුනු, ජනාධිපතිනියගේ සමීප විශ්වාසවන්තයකු වන අද්මිරාල් දයා සඳගිරි, සහන මෙහෙයුම්වල සමස්ත අන දෙන නිලධාරි ලෙස පත් කර ඇත. අනතුරුව, ඔහු දෙසැම්බර් 26 සුනාමියෙන් විපතට පත් වූ එක් එක් දිස්ත්‍රික්කයේ මිලිටරි සම්බන්ධීකරන නිලධාරින් ලෙස රියර් අද්මිරාල්වරු, එයාර් කොමදෝරුවරු, මේජර් ජෙනරාල්වරු, බ්‍රිගේඩියර්වරු හා කර්නල්වරු පත් කර තිබේ.

එහි ප්‍රතිඵලයක් ලෙස, රටේ දිස්ත්‍රික්ක 22න් 12ක් ම සඵල ලෙස මිලිටරි පාලනය යටතේ පවතී. මෙම ප්‍රදේශවල සහන කටයුතු පාලනය කිරීම යන්නෙන් අදහස් කෙරෙන්නේ ප්‍රාදේශීය හා දිස්ත්‍රික් පරිපාලනයේ බොහෝ අංශවල පාලනය යි. ඒ මක් නිසා ද කියතොත් එම ප්‍රදේශවල පවත්නා එකම කාර්යය සහන කටයුතු වන තරමට ම සිදුව ඇති ව්‍යසනය දැවැන්ත වන බැවිනි. සේවාවන් හා ප්‍රවාහන සබඳතා යලි ගොඩනැගීමේ සහ පුනස්ථාපනයේ සිට හදිසි සැපයුම් ලබාදීම සහ පොලිස් මෙහෙයුම් දක්වා වූ සියලු ම කටයුතු දැන් අධීක්ෂනය කරනු ලබන්නේ මිලිටරි ආන්ඩුකාරවරුන්ට සම නිලධාරින් විසිනි.

සිය තීන්දුව ප්‍රකාශයට පත් කිරිමට මොහොතකට පෙර, කුමාරතුංග සුනාමි ව්‍යසනය ගැන සාකච්ඡා කිරිමට සර්ව-පාක්ෂික සාකච්ඡාවක් පැවැත්වූවා ය. එහෙත් ඇය, එකතු වූ දේශපාලනඥයන් හමුවේ, තමන් සැලසුම් කරන්නේ මොනවා ද යන වග පිලිබඳ ඉඟියක් වත් කලේ නැත. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ හොරනෑවක් ලෙස ක්‍රියා කරන දෙමල ජාතික සන්ධානය (ටීඑන්ඒ) හැරුනු කොට, එකදු පක්ෂයක් වත් විරුද්ධත්වය ප්‍රකාශ කොට නැත. දක්ෂිනාංශික විපක්ෂ එක්සත් ජාතික පෙරමුන ජනාධිපතිනියගේ "ජාතිය ගොඩනැගීමේ වැඩපිලිවෙලට" සිය පූර්න සහයෝගය ප්‍රකාශ කර ඇත.

සාමාන්‍ය ජනතාව මිලිටරිය පරිත්‍යාගශීලීන් ලෙස සැලකිය යුතු වීමට කිසිදු හේතුවක් නැත. දිවයිනේ උතුරු හා නැගෙනහිර පලාත්වල දී, මිලිටරිය දෙමල සුලුතරයේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් මැඩීම එල්ල කර ගත් 20-අවුරුදු සිවිල් යුද්ධයක යෙදී ඇත. 2002 දී එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කරන තෙක්, සන්නද්ධ හමුදා විසින් දෙමල ජනයා නිරන්තරයෙන් ම හිරිහැරයන්ට ලක් කෙරුනි. දහස් ගනනක් "එල්ටීටීඊ සැකකරුවන්" ලෙස නඩු විභාගවලින් තොරව රඳවා ගැනුනු අතර සමහර අවස්ථාවල දි ඔවුහු වධ බන්ධනයන්ට ද නතු කෙරුනි.

මිලිටරිය දිවයිනේ දකුනු ප්‍රදේශවල 1980 ගනන් අග පැන නැගුනු ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) නැගිටීමක් ප්‍රචන්ඩ ලෙස මර්දනය කලේ ය. මෙම මෙහෙයුම තුල දී, හමුදාව හා එයට සම්බන්ධිත ඝාතක කල්ලි විසින් 100,000ක පමන ග්‍රාමීය සිංහල තරුනයන් ඝාතනය කෙරුනි යයි තක්සේරු කෙරෙන අතර, එය එල්ල කෙරුනේ හුදෙක් ජවිපෙට එරෙහිව පමනක් නොව, විරැකියාව හා දරිද්‍රතාව හේතු කොට ගෙන වැඩෙමින් පැවති වඩා පුලුල් නොසන්සුන්තාවන්ට ද එරෙහිව ය.

මිලිටරියට සහන කටයුතුවල පාලනය භාර දීමේ තීන්දුවට දැනටමත් ස්වේච්ඡා ආධාර සංවිධාන ගනනාවක් විරෝධය දක්වා ඇත. එයට ප්‍රතිචාර වසයෙන්, කුමාරතුංග නිවේදනය කලේ, මිලිටරි නිලධාරින් සරනගත කඳවුරුවලට ආධාර බෙදාහැරීම සම්බන්ධීකරනයට පමනක් සීමා වනු ඇති බව යි. කෙසේ වෙතත්, යථාර්ථය වනුයේ, ඉහල මිලිටරි නිලධාරින් පලාත් හා දිස්ත්‍රික් මට්ටමේ සිවිල් පරිපාලනය සම්බන්ධයෙන් බලගතු කාර්ය භාරයක් දිගට ම ඉටු කරනු ඇත යන්න යි.

"ආරක්ෂාව" සහතික කිරීමට අවශ්‍ය පියවරක් ලෙස සහන මෙහෙයුම්වල පාලනය මිලිටරියට භාර දීම යුක්තියුක්ත කිරීමට ආන්ඩුව හා මාධ්‍ය ප්‍රයත්න දරා ඇත. සුනාමියෙන් විපතට පත් වූවන්ට එරෙහි අපරාධ ගැන අවධාරනය කරමින් කොලඹ පුවත්පත්වල අතිශයෝක්තියට නැංවූ ප්‍රවෘත්ති ගනනාවක් ම පල කෙරී තිබේ. කෙසේ වෙතත්, යුද්ධය නිසා අවතැන් වූ ජනයා වෙසෙන සරනගත කඳවුරු වසර 20කට වැඩි

කලක් තිස්සේ පැවති නමුත්, මිලිටරිය ඒවායේ පාලනය භාර ගත් ප්‍රථම අවස්ථාව මෙයයි.

මිලිටරියේ හා ඔත්තු සේවාවන්ගේ ඉහළ නිලධාරින් සමග සමීප සබඳතා පවතින *සන්ඩේ ටයිම්ස්* ආරක්ෂක ලියුම්කරු ඉක්බාල් අතාස් ජනාධිපතිනියගේ තීන්දුව “මුලුමනින් ම පාහේ අහඹු සිදුවීමක්” ලෙස හුවා දැක්වී ය. සරනගත කඳවුරක දී ගැහැනු ළමයකු දූෂනය කිරීම ගැන “කොළඹ පැවති ඉහල පෙලේ රැස්වීමක” සාකච්ඡා වූ බවත් “ආරක්ෂක හමුදාවල මැදිහත්වීම අත්‍යවශ්‍ය යයි වහා ම තීන්දු කෙරුනු” බවත් ඔහු ලිවී ය.

සැබෑ ගාමකය වන්නේ සමාජ අසහනය පිලිබඳව නිල කව තුල පවත්නා භීතිය යි. ව්‍යසනය මගින් 800,000කට වැඩි ජනකායකට උන්හිටි තැන් අහිමි කෙරී ඇත. මුල් දින දෙක තුල දී, සන්නද්ධ හමුදා ඇතුලු සමස්ත පාලන යන්ත්‍රනය ම මුලුමනින් ම අකර්නම්‍ය තත්වයක පැවතුනි. සාමාන්‍ය වැඩ කරන ජනයාගේ ක්‍රියාකාරිත්වය හා සහයෝගය නොතිබෙන්නට දිවි ගලවා ගත්තවුන්ගෙන් බොහොමයක් මිය යාමට ඉඩ තිබුනි.

සීමිත ආහාර, ජලය හා වෛද්‍ය පහසුකම් සහිතව සරනගත කඳවුරුවල සිටි ජනයාගේ මනෝගතිය, ආරම්භක කම්පනයෙන් අනතුරුව වෛරයට පෙරලෙමින් තිබූ බව ලෝක සමාජවාදී වෙබ් අඩවියේ වාර්තාකරුවන්ට මෙන් ම සෙසු මාධ්‍යවේදීන්ට ද දැන ගන්ට ලැබුනි. ආන්ඩුව පැත්තෙන් ක්‍රියාත්මක නොවීම හා නිල සහන කටයුතුවල පැවති අවුල් සහගත භාවය හේතු කොට ගෙන තියුනු විවේචන ඇවුලුනි. සංස්ථාපිත දේශපාලන පක්ෂ එකක් වත් තමන් හමුවීමට පැමිනියේ වත් කිසිදු උත්සුකතාවක් දැක්වූයේ වත් නැති බව විපතට පත් වූවෝ පෙන්වා දුන්හ. මිලිටරියට සහන කටයුතුවල පාලනය භාර දීමෙන් කුමාරතුංග බලාපොරොත්තු වන්නේ මොන යම් හෝ කැරලිකාරිත්වයක් කල් තියා මැඩලීම ය.

## දේශපාලන ආතතීන්

මෙම තියුනු සමාජ හා දේශපාලන ආතතීන් හුදෙක් මෑත ම ව්‍යසනය නිසා හටගත් ඒවා නොවේ. එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කොට සාම සාකච්ඡාවලට අවතීර්න වීමට හිටපු එජාපෙ ආන්ඩුව ගත් තීන්දුව පාලක කව තුල දිගු කලක් තිස්සේ පැවති අර්බුදයක් උත්සන්න කලේ ය. ව්‍යාපාරිකයන් අතර සිටින වඩා ආධිපත්‍යය දරන කොටස් තර්ක කලේ, යුද්ධය අවසන් කිරීමටත් ආර්ථික කඩාවැටීමක් වලකාගැනීමටත් එල්ටීටීඊය සමග බලය බෙදා ගැනීමේ සම්මුතියක් අවශ්‍ය බවට යි.

මහා බලවතුන්ගේ පිටුබලය ද සහිතව, එජාපෙ “සාම ක්‍රියාදාමය” — එනම් එල්ටීටීඊය සමග ගිවිසුමක් ඇති කර ගැනීමට ප්‍රයත්න දරමින් ම වඩා දුර දිග යන ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙලක් ක්‍රියාවට දැමීම — ඉදිරියට ගෙන ගියේ ය. එවකට විපක්ෂයේ සිටි පොදු පෙරමුනේ නායිකාව වූ කුමාරතුංග, ජවිපෙ හා මිලිටරියේ ඉහල නායකත්වය සමග එක්ව, සාම සාකච්ඡා ජාතිය පාවාදීමක් ලෙස හෙලා දැකීමෙහි යෙදී ගත්තා ය. ආන්ඩුව එල්ටීටීඊය සමග ගෙන ගිය සාකච්ඡාවන්ට වල කැපූ මිලිටරි ප්‍රකෝපකරනයන් මාලාවක් ම ඇති කිරීමෙහි ලා අද්මිරාල් සඳගිරි මූලික ක්‍රියාකලාපයක් ඉටු කලේ ය.

එල්ටීටීඊය උතුරු හා නැගෙනහිර පලාත්වල අන්තර් වාර පාලනයක් ස්ථාපිත කිරීමේ සිය යෝජනා ප්‍රකාශයට පත් කිරීමෙන් දින කිහිපයකට පසුව, 2003 නොවැම්බරයේ දි ආතතීන් උච්චස්ථානයකට ලඟා විය. ආන්ඩුව ජාතික ආරක්ෂාවට වල කපන බව ප්‍රකාශ කරමින්, ජනාධිපතිනිය මූලික අමාත්‍යංශ තුනක පාලනය සියතට ගෙන හදිසි නීතිය පැනවීමේ සැලසුම් ද නිවේදනය කලා ය. වොෂිංටනයේ හා නව දිල්ලියේ පීඩනය යටතේ අවසානයේ දී පසුබැසීමට ඇයට බල කෙරුනු නමුත් කොලඹ පාලනය තුන් මසක් තිස්සේ දේශපාලන හිරවීමක පැවතීමෙන් අනතුරුව, ඇය සිය අභිමතය පරිදි ආන්ඩුව බලයෙන් පහ කොට නව මැතිවරනයක් කැඳවූවා ය.

කුමාරතුංග ජවිපෙ සමග එක්ව එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) පිහිටුවූ අතර එය එජාපෙ ආර්ථික පිලිවෙත් සම්බන්ධයෙන් පැවති පුලුල් අසන්තෘප්තිය ගසාකමින් 2004 අප්‍රේල් මැතිවරනයෙන් යන්තම් ජය ලැබී ය. මැතිවරනය අස්ථාවර සුලුතර ආන්ඩුවක් පිහිටුවීමට තුඩු දුන් අතර පාදක ගැටලු එකක් වත් විසඳාලීමට ද අසමත් විය. එල්ටීටීඊයේ අන්තර් වාර පාලන යෝජනා මත සාකච්ඡා ගෙන ගිය හොත් තමන් ආන්ඩුවෙන් ඉවත් වන බවට ජවිපෙ තර්ජනය කිරීමත් සමග, සාම ක්‍රියාදාමය යලි ඇරඹීමේ තමන්ගේ ම ප්‍රයත්නයන් අරභයා එජනිස තුල ගැඹුරු භේදයන් හටගෙන තිබේ. එමෙන් ම, ආන්ඩුව සිය මැතිවරන පොරොන්දු කඩකිරීම හා ජීවන මට්ටම් අඛන්ඩව පහල වැටීම හේතු කොට ගෙන ආන්ඩුවට එරෙහිව වෛරය ද වැඩෙමින් පවතී.

දෙසැම්බර් 26 ව්‍යසනය මෙම ආතතීන් වැඩිදියුනු කිරීමට හේතු වී ඇත. ආන්ඩුවේ අකර්මන්‍යතාව, තමන් මුහුන දෙන අති මූලික ප්‍රශ්න කිසිවක් විසඳාලීමෙහි ලා පාලක පන්තිය දක්වන අපොහොසත් භාවයේ ලක්ෂනයකි. 2003 නොවැම්බර් සිද්ධීන් මගින් පෙන්නුම් කෙරුනු පරිදි, පාලක ප්‍රභූවේ කොටස් ඒකාධිපති පාලන රූපයන් කරා මාරු වීම ගැන සිතා බලති.

## "ක්‍රියාවට දක්ෂ මිනිසුන්"

*දි අයිලන්ඩ්* පුවත්පත මෙම තේමාව අඛන්ඩව වාදනය කර ඇත: එනම්, ප්‍රජාතන්ත්‍ර විරෝධී පිලිවෙත් යොදා ගැනීම යුක්තියුක්ත කරනු වස් ප්‍රධාන දේශපාලන පක්ෂ කෙරෙහි පවත්නා මහජන වෛරයට ආයාචනා කිරීම. එය සහන කටයුතුවල පාලනයට මිලිටරිය පත් කිරීමේ කුමාරතුංගගේ තීන්දුවට අත්පොලොසන් දීම පුදුමයට කරුනක් නොවේ.

"අවශ්‍ය කර තිබේ: පක්ෂවල හිතවතුන් හා ඥාතිමිත්‍රාදීන් නොව ක්‍රියාවට දක්ෂ මිනිසුන්" යන මැයෙන් ජනවාරි 5 දා පල වූ කතුවැකියක් තුල, පුවත්පත ව්‍යසනයට දේශපාලනඥයන් දැක්වූ ප්‍රතිචාරය හා හදිසි සැපයුම් ලබා දීමට ඔවුන් දැක්වූ අපොහොසත් භාවය තියුනු විවේචනයට ලක් කලේ ය. "මෙවන් ආපදා කලමනාකරන මෙහෙයුම්වල පාලනය දැරීමට හොඳම අය වන්නේ ක්ෂේත්‍රවල අත්දැකීම් සහිත හමුදා භටයන් බවට අපට උපදෙස් ලැබී ඇත. බාධාකාරී රෙගුලාසි බිඳගෙන යාමටත් තමන්ගේ මග හරස් කරන ඕනෑම උත්තමයකුගේ පස්සට පයින් ගසමින් සිය මාවත බලාත්කාරයෙන් සකසා ගැනීමටත් ඔවුන්ට හැකි විය යුතු ය." යැයි එය නිගමනය කරයි.

සහන මෙහෙයුම්වල පාලනය මිලිටරියට භාර දීම උතුරේ හා නැගෙනහිර වාර්ගික ආතතීන් ඇවිලීම ද එල්ල කර ගනී. මෙම ප්‍රදේශවල සාමාන්‍ය ජනයා සුනාමි ප්‍රහාරයට දැක්වූ ක්ෂනික ප්‍රතික්‍රියාව වූයේ භාෂා, ආගමික හෝ ජනවාර්ගික පසුබිම නොතකා විපතට පත්වූවන්ට උපකාර කිරීම යි. කෙසේ වෙතත්, සන්නද්ධ හමුදාවන් සිංහල ස්වෝත්තමවාදය තුල ගැඹුරින් ම ගිලී සිටින අතර මිලිටරියේ ඉහල නායකත්වයේ සැලකිය යුතු කොටසක් එල්ටීටීඊය සමග මොන යම් හෝ සාම සම්මුතියක් ඇති කර ගැනීමට විරුද්ධ ය.

පසුගිය වසරේ මාර්තු මස සිට, මිලිටරි ඔත්තු අංශ, තම ප්‍රතිවාදීන් සමග කාකොටා ගැනීමක යෙදී සිටින නැගෙනහිර පලාත පාදකව ක්‍රියාත්මක වන එල්ටීටීඊයෙන් බිඳුනු කන්ඩායමක් සමග රහස් සහයෝගිතාවක නිමග්නව සිටී. මෙම ක්‍රියාවන් සාම සාකච්ඡා යලි ඇරඹීමේ උත්සාහයන්ට වල කපා වත්මන් සටන් විරාමය බිඳවැටීමේ අද්දරට තල්ලු කර තිබේ.

සහන සේවා සම්බන්ධයෙන් සන්නද්ධ හමුදාවන් සහ එල්ටීටීඊය අතර ඝර්ෂනයන් හටගෙන ඇති බවට නව වාර්තාවන් ලැබෙමින් පවතී. තරුනයන් බලාත්කාරයෙන් බඳවා ගන්නා බවට එල්ටීටීඊයට චෝදනා කරමින්, මිලිටරිය, සහන කඳවුරු තුල, එල්ටීටීඊයට සම්බන්ධ දෙමල පුනරුත්ථාපන සංවිධානයේ (ටීආර්ඕ) වැඩ කටයුතුවලට බාධා පමුනුවා තිබේ. "විශේෂ කාර්ය බලකායේ සොල්දාදුවන් සහන භාන්ඩ රැගෙන යන ටීආර්ඕ ට්‍රැක්ටර් දෙකක් අත්අඩංගුවට ගෙන එම භාන්ඩවල ටීආර්ඕ ලේබල ඉවත් කිරීමෙන් අනතුරුව ඒවා තමන්ගේ භාරයෙන් බෙදා හැරිය" බව, ටීආර්ඕ විධායක අධ්‍යක්ෂ කේ.පී. රෙජී පසුගිය සතියේ ප්‍රවෘත්ති සාකච්ඡාවක දී පැවසී ය.

කුමාරතුංගගේ මෑතම තීන්දුව මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් පාගා දමන ප්‍රකෝපකාරී ක්‍රියාවක් වන අතර උතුරු හා නැගෙනහිර පලාත්වල සන්නද්ධ ගැටුමක් අවුලුවාලීමේ හැකියාවෙන් ද යුත් පියවරකි. ඇගේ සැලකිල්ල යොමුව පවතින්නේ, සිය ජීවිත කාලයේ දී අත්දැකි විශාලතම ආපදාවට මුහුන දී සිටින ලක්ෂ සංඛ්‍යාත දෙමල, මුස්ලිම් හා සිංහල සාමාන්‍ය ජනතාවගේ ඉරනම සම්බන්ධයෙන් නම් නොවේ.

© www.wsws.org